දිවයින 2020. 06. 03 පිටුව 13

# මැයි මාසයේ උද්ධමනය 4% යි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

පසුගිය මැයි මාසයේ උද්ධමනය සියයට 4 දක්වා අඩු වී තිබේ.

මේ අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය පසුගිය අප්‍රේල් මාසයේ පැවති සියයට 52% සිට 2020 මැයි මාසයේ දී සියයට 40% දක්වා පහළ ගිය අතර, 2019 මැයි මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා පූර්ණ වශයෙන් දායක වූ බව මහ බැංකුව පවසයි.

ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ පැවති සියයට 132% සිට 2020 මැයි මාසයේදී සියයට 99% දක්වා සහ ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය ද 2020 අප්‍රේල් මාසයේ පැවති සියයට 21%හි සිට 2020 මැයි මාසයේදී සියයට 16% දක්වා පහළ ගිය බව මහ බැංකුව තවදුරටත් පවසයි.